සැ. යු. - 2020.03.20 දින පළ වූ අංක 2168 දරන ගැසට් පත්‍රයේ I : II (අ) සහ IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,169 - 2020 මාර්තු මස 27 වැනි සිකුරාදා - 2020.03.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 594 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2020 අප්‍රේල් මස 17 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 අප්‍රේල් මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# රජයේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

කොළඹ දිස්ත්‍රික්කයේ, අංක 90/2ඒ, දියගම, කිරිවත්තුඩුව පදිංචි දිසානායක ලියනගේ චරිත ලංකානාථ දිසානායක (ජා. හැ. අ. 852011335 V) වන වන මා විසින් අංක 90/2ඒ, දියගම, කිරිවත්තුඩුව, පදිංචිව සිටින අංක 875770837 V දරන ජාතික හැඳුනුම් පත්‍රය හිමි දමුණුපොල අප්පුහාමිලාගේ කෝසලී අනුපමා වෙත ප්‍රදානය කළ වර්ෂ 2019 ක් වූ ජනවාරි මස 26 දින කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. වීරසිංහ මහතා විසින් ලියා සහතික කරන ලද අංක 624 දරන ඇටෝර්නි බලපත්‍රය මෙවක් පටන් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසිකොට අවලංගු කරමි. මින් පසු ඇය විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා වග නොකියන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හා එහි ජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

දිසානායක ලියනගේ චරිත ලංකානාථ දිසානායක.

03 - 986

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීමයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දර්ගා නගරයේ ලෝටස් පාරේ, අංක 83 හි පදිංචි මොහමඩ් සහීඩ් මොහමඩ් සුහයිර් වන මා විසින් එකී ශ්‍රී ලංකා ජනරජයේ දර්ගා නගරයේ ලෝටස් පාරේ, අංක 66හි පදිංචි මොහමඩ් රෂීඩ් සෆීනා උම්මා යන අයහට ප්‍රදනය කරන ලද කළුතර ප්‍රසිද්ධ නොතාරිස් හා නීතිඥ M. R. හයිඩර් හසන් විසින් ලියා සහතික කරන ලද අංක 493 හා 2008 ජුනි මස 10 වැනි දින දාතම දරන විශේෂ ඇටර්නි බලපත්‍රය, 2020 ජනවාරි මස 07 දින සිට බලපැවැත්වෙන පරිදි, ප්‍රත්‍යාදිෂ්ඨ කොට, අවලංගු කරන ලද බැව් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, පොදු මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

මොහමඩ් සහීඩ් මොහමඩ් සුහයිර්.

03 - 992

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීමයි

කොට්ටාව, සාමසිරිපුර, රුහුණු මාවතේ අංක 108/1A දරන ස්ථානයෙහි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 810581433වී හිමි විතානාච්චි දොන් නුවන් සංජය ගනේගම වන මා විසින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඒ. එන්. දිසානායක මහත්මිය විසින් 2012.08.10 දින දී ලියා සහතික කළ අංක 1385 දරන ඇටෝර්නි බලපත්‍රය ප්‍රකාරව පන්නිපිටිය, මාඹුල්ගොඩ, අංක 75/10 දරන ස්ථානයෙහි පදිංචිව සිටින ජාතික හැඳුනුම් පත් අංක 551092070වී හිමි වල්පොලගේ සිරිසේන යන අය වෙත පවරා දෙන ලද සියලුම ඇටෝර්නි බලතල අද දින සිට අවලංගු කරන ලද බව මෙයින් සියළු දෙනා වෙත දන්වා සිටිමි.

විතානාච්චි දොන් නුවන් සංජය ගනේගම.

2019 ඔක්තෝබර් මස 23 වැනි දින.

03 - 910

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු :-

සමාගමේ නම : ගමගේ මැනේජ්මන්ට් සොලූෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි අංකය : පී. වී. 127067
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 339/2/සී/1, ඇරැව්වල, පන්නිපිටිය,
ලියාපදිංචි දිනය : 2017.11.09

සමාගමේ නම : හෝම් කිචන් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී. වී. 00208940
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 54, කොළඹ පාර, කඩුගන්නාව, යටිනුවර
ලියාපදිංචි දිනය : 2019.02.17

සමාගමේ නම : හැස්ඩ් ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී,
ලියාපදිංචි අංකය : පී. වී. 00210059
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 31/2, පළමු පටුමග, කිරුලපන, කොළඹ 05
ලියාපදිංචි දිනය : 2019.03.21

සමාගමේ නම : සෙනාරා ට්‍රේඩින් (පීවීටී) එල්ටීඩී,
ලියාපදිංචි අංකය : පී. වී. 00210123
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 102, පමුණුව පාර, මහරගම
ලියාපදිංචි දිනය : 2019.03.22

ඉහත සඳහන් සමාගම්හි ලේකම්වරු.

03 - 942

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.